# ශ්‍රී ලංකාවේ පාරම්පරික තේවා සම්ප්‍රදාය

බොරලංකඩ වංසරතන හිමි[1]

ලාංකික දේව සංකල්පය ක්‍රි.පූ. තුන් වැනි සියවසට පෙර කාල පරාසය දක්වා දිවයයි. බෞද්ධ සංකල්පය හා හින්දු දේව සංකල්ප සංකලනය මත ගොඩනැඟුණු දේවාල සහ එකී දේවාල සම්බන්ධ තේවාවන් පිළිබඳ ක්‍රමවේදයන්ගේ ඓතිහාසිකත්වය අස්පර්ශීය පුරාවිද්‍යා සාධක තුළින් ඉස්මතු වේ. රාජකීය දේවාලයක රාජකාරි පිළිබඳව සහ එම රාජකාරිවල ස්වභාවය පිළිබඳ සඳහන් මැදගොඩ සන්නස වැදගත් ඉපැරණි ලේඛනයකි. එකී ලේඛනය ප්‍රකාරව සීතාවක රාජසිංහ රජු විසින් මැදගොඩ පත්තිනි දේවාලය ඉදිකර එහි තේවාවන් සිදු කරන පංගුකාරයින්ට භුක්තිවිදීමට ඉඩ-කඩම් බෙදාදී ඇති අතර එකී භුක්තිකාරයින්ට දේවාලය නඩත්තු කිරීමට සන්නස මගින් ආඥා කොට ඇත. මෙහි තේවාවන් වශයෙන් කපුගේ පංගුව, ලෙවන්ගමගේ පංගුව, හේනේමාමාගේ පංගුව, නක්කාවල මනන්නාගේ පංගුව ආදී තේවාවන් විසි එකක් සඳහන් කර තිබේ. එපමණක් ද නොව එම තේවාවන් පාරම්පරික පංගුකාරයින් විසින් මෑතක්වන තුරුම නොකඩවා සිදුකර තිබේ. මැදගොඩ සන්නස ප්‍රකාරව තේවාවන් පංගුකාරයින් විසි එක් දෙනෙක් අතර බෙදී ගියත් අද වනවිට ඉතිරිවී ඇත්තේ ඇතුල් කට්ටලේ ප්‍රධානියා වන කපුරාළගේ පංගුව පමණි. මුරුතැන් බැම හෙවත් දේව පූජාව පැවැත්වීම, යාතිකා කිරීම, පරහඳ දීම යනාදි තේවා රාජකාරි දහයක් කපු පංගුවට අයත් වේ. නමුත් අනෙක් පංගුකාරයින් අද වනවිට එකී දේවාලයට අයත් ඉඩ-කඩම්වල දැකගැනීමට නොහැකිය. බොහෝ දෙනෙකු එම රාජකාරි පැහැරහැර සමාජයේ ඉහළ පැලැන්තියේ අය බවට පත්වීම හා එම නවීන සමාජය සමග ජීවත්වන්නන් ඒ සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් ජනයා ඇසුරු කිරීමට සිදුවීමය. එපමණක් ද නොව සාම්ප්‍රධායික තනතුරු දෙස හා එම දරුවන් දෙස නවීන සමජය පිළිකුලෙන් බැලීම ද එයට හේතු වී ඇත. එම කාර්යන් භාරව කටයුතු කළ පරපුර තේවාවන් පැහැරහැර ඇති බැවින් වර්තමානයේ එය සිදුකළ යුත්තේ කුලියක් ගෙවා වෙන අයෙකු මාර්ගයෙනි. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ගැටළුව ශ්‍රී ලංකාවේ පාරම්පරික තේවා සම්ප්‍රදාය හා බැඳුණු සංස්කෘතික සන්දර්භය හඳුනාගැනීමේ දී මැදගොඩ පත්තිනි දේවාල සන්නස කෙතෙක් දුරට වැදගත්වන්නේ ද? එසේම ඒ හා බැඳුණු සංස්කෘතික ගතිකයන් කෙසේ ද යන්න විමසා බැලීම වනඅතර දත්ත රැස් කිරීමට මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා කේවල අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා ආදි ක්‍රමවේද භාවිත කරන ලදි.

**ප්‍රමුඛ පද** : තේවා සම්ප්‍රදාය, මැදගොඩ සන්නස, මැදගොඩ දේවාලය

[1] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. boralankadawansa@gmail.com